**මාධ්‍ය නිවේදනය**

2020 මැයි 4, කොළඹදී...

Nestlé
Good food, Good life

# අධ්‍යාපන අමාත්‍යාංශය සහ නෙස්ලේ එක්ව ශ්‍රී ලංකාවේ ප්‍රථම නිල විද්‍යුත් ඉගෙනුම් ‘පෝෂණයයි, සුව දිවියයි’ වැඩසටහන දියත් කරයි - Nestlé Healthy Kids

ශ්‍රී ලංකාවේ පාසල් ළමුන් මිලියන 4.5 කට ආසන්න සංඛ්‍යාවක් නිවාසවලට සීමා වී සිටින මේ මොහොතේ, විද්‍යුත් ඉගෙනුම්, විශේෂ නව වැදගත්කමක් ලබා ගෙන ඇත. මෙම කාලය තුළ පෝෂණය, සෞඛ්‍යය, ආහාර සුරක්ෂිතතාවය සහ සනීපාරක්ෂාව පිළිබඳව තම දරුවන්ට ඉගැන්වීමට දෙමාපියන්ට උපකාර කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ නෙස්ලේ ආයතනය දිගු කලක් තිස්සේ ක්‍රියාත්මක කළ Nestlé Healthy Kids වැඩසටහනේ විද්‍යුත් ඉගෙනුම් සංස්කරණය (e-learning version) දියත් කර තිබේ. රජයේ පාසල්වල විෂය බාහිර විෂයයක් ලෙස අමාත්‍යාංශ අධ්‍යාපනඥයින් විසින් සාමාන්‍යයෙන් උගන්වනු ලබන මෙම වැඩසටහන, පාසල් ළමුන්ට පෝෂණය හා සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් පිළිබඳව දැනුවත් කිරීම අරමුණු කරයි. http://tiny.cc/ozucoz වෙබ් අඩවිය හරහා ඉදිරිපත් කෙරෙන එය, ශ්‍රී ලංකාවේ ප්‍රථම නිල විද්‍යුත් ඉගෙනුම් ‘පෝෂණයයි, සුව දිවියයි’ වැඩසටහනයි.

“Nestlé Healthy Kids වැඩසටහනේ 10 වන වසර සම්පූර්ණ කිරීමට ආසන්න මේ අවස්ථාවේදී, සෞඛ්‍ය සම්පන්න පරම්පරාවක් ඇති කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කිරීමට ලැබීම අපට ගෞරවයක්. හොඳ සෞඛ්‍යයක වැදගත්කම අවබෝධ කර ගැනීම හා සහතික කිරීම, වෙන කවරදාකටත් වඩා අද අත්‍යවශ්‍ය වී තිබෙනවා. ළමා කාලය යනු ජීවිත කාලය පුරාම රැඳෙන පුරුදු ඇති කර ගන්නා කාලයයි. විද්‍යුත් ඉගෙනීම යනු අනාගතයයි සහ මේ අවස්ථාවේ අඛණ්ඩ අධ්‍යාපනයක් සඳහා ඇති අවශ්‍යතාවයක්. මෙම නව යථාර්ථය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ශ්‍රී ලංකාවේ පළමු නිල විද්‍යුත් ඉගෙනුම් ‘පෝෂණයයි, සුව දිවියයි’ වැඩසටහන දියත් කිරීමට ලැබීම ගැන අපි ආඩම්බර වෙමු.” යැයි නෙස්ලේ හි කළමනාකාර අධ්‍යක්ෂ ෆැබ්රිස් කැවලින් මහතා පැවසීය.

මෙම විද්‍යුත් ඉගෙනුම් වැඩසටහන නවීන, අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම් (interactive learning) ශෛලියකින් සමන්විත වන අතර, පාසැල් විෂය මාලාවට සහාය වීම සඳහා අන්තර්ගතය නිර්මාණය කර ඇත. ඉගෙනුම් ඒකක හයකින් සමන්විත මෙම පාඨමාලාව තුළ එක් එක් ඒකකය අවසානයේ ඇගයුමක් ඇති අතර එය භාෂා තුනෙන්ම ලබාගත

හැකිය. 60% ට වඩා ලකුණු ලබා ගත් අයට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිල සහතිකයක් ද ලැබෙනු ඇත.